ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනපති උපාධි වැඩ සටහන

අවසාන පරීක්ෂණය - 2007

ගුරු අධ්‍යාපනය - **ESP** 2317

කාලය පැය තුනයි.

016

---

දිනය - 2007.07.15 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

ඕනෑම ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

01. **i.** 'වෘත්තීයතාව' යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 05)

**ii,** සාර්ථක පන්ති කාමර ඉගැන්වීමක් සඳහා ගුරු භවතකු සතු විය යුතු ප්‍රධාන වෘත්තීමය කුසලතා පහක් විස්තර කරන්න. (ලකුණු 10)

**iii.** ගුරුවරුන් තුළ මෙම වෘත්තීමය කුසලතා සංවර්ධනය කළ විට සිසුන්ට අත්වන ප්‍රතිලාභ විභාග කරන්න. (ලකුණු 08)

**iv,** මෙම කුසලතා ගුරුවරුන් තුළ ප්‍රශස්ත මට්ටමින් සංවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකාවට හඳුන්වා දිය හැකි නව්කරණය වූ ගුරු පුහුණු වැඩසටහන් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 33)

02. **i.** 'දුරස්ථ අධ්‍යාපනය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 05)

**ii.** ලොව පුරා බොහෝ රටවල් තම ගුරුවරුන් පුහුණු කිරීම සඳහා දුරස්ථ ක්‍රමය යොදාගෙන ඇත්තේ කුමන හේතු නිසාද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 07)

**iii.** දුරස්ථ ක්‍රමය භාවිත කර ගුරුවරුන් පුහුණු කිරීමේ වාසි තුනක් හා අවාසි තුනක් දක්වන්න. (ලකුණු 12)

**iv.** ඔබ ඉහත හඳුනා ගත් අවාසි අවම කර ගැනීමට යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 09)

(මුළු ලකුණු 33)

03. **i.** ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තියේ ගුණාත්මක භාවය කෙරෙහි බලපෑම් කරන ප්‍රධාන ගැටළු පහක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

**ii.** ඔබ ඉහත හඳුනාගත් ගැටළු විසඳීමට යොදා ගත හැකි ක්‍රියා මාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 18)

(මුළු ලකුණු 33)

04. 'ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ක්‍රමය දැඩි අවධානයක් යොමු කළයුතු අංශයක් වන්නේ සේවයේ යෙදී සිටින වෘත්තීය කුසලතා අඩු ගුරුවරුන් පුහුණු කිරීමේ අවශ්‍යතාවයි.'

i. ශ්‍රී ලංකාවේ සේවාස්ථ ගුරු අධ්‍යාපනය සැපයීම සඳහා ඇති පහසුකම් පිළිබඳ කෙටි විස්තරයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

ii. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන සේවාස්ථ ගුරු අධ්‍යාපන වැඩ සටහනක් තෝරා ගන්න. එම වැඩ සටහනේ ගුරු පුහුණු සංරචකයේ ව්‍යුහය හා එහි වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

iii. එම ගුරු පුහුණු සංරචකයේ ප්‍රබලතා හා දුබලතා සාකච්ඡා කරන්න. (ලකුණු 13)

(මුළු ලකුණු 33)

05. i. 1994 වසරේදී ශ්‍රී ලංකාවේ ගුරු සේවය ස්ථාපනය කිරීම සඳහා බලපෑ සමාජ -ආර්ථික හා අධ්‍යාපනික සාධක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ශ්‍රී ලංකා ගුරු සේවය ස්ථාපනය කිරීම ශ්‍රී ලංකාවේ ගුරුවරුන්ගේ ඉහළ සමාජ සචලතාව කෙරෙහි බලපා ඇත්දැයි සාකච්ඡා කරන්න. (ලකුණු 10)

iii. ශ්‍රී ලංකා ගුරු සේවය ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දුන් බාධක තුනක් විභාග කරන්න. (ලකුණු 13)

(මුළු ලකුණු 33)

06. පහත දැක්වෙන ප්‍රකාශයන් අතුරින් ඕනෑම තුනක් පිළිබඳව ඔබේ අදහස් දක්වන්න.

i. ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි දියුණු කර ගැනීම බෙහෙවින් රඳා පවතින්නේ ගුරුවරුන් අලුතින් බඳවා ගැනීමේ හා විහිදුවා හැරීමේ (**deployment** )සංවිධිතභාවය මතය.

ii. ශ්‍රී ලංකාවේ ගුරු වෘත්තීය සංගම් ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනයට වඩා ඔවුන්ගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද ගැන වැඩි අවධානය යොමු කරයි.

iii. ශ්‍රී ලංකාවේ ගුරුවරුන්ගේ වෘත්තීය තත්ත්වය ඉහළ නැංවීම සඳහා ගුරු ආචාර ධර්ම මාලාවක් තිබීම අත්‍යවශ්‍යය.

iv. පාසල් විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය තුළ ගුරුවරුන්ගේ සහභාගිත්වය ඉතා වැදගත් වේ.

(ලකුණු 11 3 = 33)

\- හිමිකම් ඇවිරිණි. -